**ඉන්දියාව මී කඩන්නේ අත ලෙවකන්න නොවේ. ඉන්දියාව මී කඩන්නේ මීවද අයිති පරිසරයේ හිමි කාරයින්ට වත් ඔවුන්ගේ කොටස නොදී සකල වපසරියම කටේ ඔබා ගැනීමටයි. ඉන්දියාව හා නෝර්වේ අතර ශ්‍රී ලංකාවේ තෙල් නිධි පිළිබඳව කිසියම් අවබෝධයක් තියෙන බව පෙනෙන්නට ඇත. සටන් විරාම ගිවිසුම කාලේ නෝර්වේ තෙල් ඇමති නිතර නිතර ඉන්දියාවේ බලශක්තියට අදාල බලධාරීන් මුණ ගැසුණි. ඒ අතර එරික් සෝල්හයිම් ලංකාවට ආවේත් ඔස්ලෝ ගියෙත් නවදිල්ලිය හරහා ලංකාවේදි සිදු කරන්න යනදේවල් වගේම සිදු කරපු දේවල් සියල්ල කලාපයේ බලවතා වන ඉන්දියාව දැනුවත් කිරීමෙන් පසුවය.**




# ත්‍රිකුණාමලයේ ඉන්දියානු ආර්ථික කලාපය

වර්තමානයේ දී විශාල වශයෙන් ලංකාවේ ඛනිජ සම්පත් ඉලක්ක කරගෙන ක්‍රියාත්මක වන ඉන්දියානු ආර්ථික ව්‍යාප්තවාදය තව තවත් ඉදිරියට ගෙනයාම ඉන්දියාවේ උවමනාවයි. ඒ උවමනාව පිළිඹිබු කරන නොයෙකුත් සාක්ෂි අතර මේ දිනවල නැගෙනහිර පළාතට කරනු ලබන ඉන්දියානු මැදිහත් වීම් පිළිබඳව විශාල අවධානයක් යොමුවී ඇත. සාම්පූර්හි ඉදි කෙරෙන විදුලි බලාගාරයත්, එහි විදුලිය බෙදාහැරී මේ හා මුදල් එකතු කිරීමේ බලය පවා ඉන්දියාවට හිමිවීමත් හේතුකොට ගෙන මේ මැදිහත්වීම ගැන සැකය තව තවත් තහවුරු වෙමින් තිබේ. සාම්පූර් වලට කෙලින්ම නැව් මගින් බඩු ගෙනයාමට හා ගොඩබෑමට එහි නව ජැටියක් ඉදිකෙරෙමින් පවතී. පුල්මුඩේ සිට සාම්පූර් දක්වා අධිවේගී මාර්ගයක් ඉදි කෙරෙමින් පවතින අතර එය ගාන්ධි මාවත ලෙස නම් කර ඇත. මේ මාර්ගය ඉදිකර ඇත්තේ පුල්මුඩේ ඛනිජ වැලි නිධිය ඉලක්කකරගෙන බව ඉතා පැහැදිලිය. මේ අතර ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ විශේෂ ආර්ථික කලාපයක් නම්කර එහි ඉඩම් ඉන්දියාවට පවරා ඇති බව තොරතුරු ලැබී ඇත. අපි මම ලිපියෙන් එකී ආර්ථික කලාපයේ තොරතුරු විමසා බලමු.

ත්‍රිකුණාමල වරාය ආශ්‍රිතව විශාල ඉඩම් ප්‍රමාණයක් විශේෂ ආර්ථික කලාපයක් ලෙස වෙන්කර ඇත්දැයි පාර්ලිමේන්තුවේදී පැන නැගුනු ප්‍රශ්නයකට වරාය විෂය භාර ඇමතිවරයා ප්‍රකාශ කර සිටියේ එවැන්නක් පිළිබඳව තමා නම් නොදන්නා බවය. විෂය භාර ඇමතිවරයාට ද නොදන්වා ගොඩනගන ලද ත්‍රිකුණාමලය විශේෂ ආර්ථික කලාපයේ සියළු' තොරතුරු මේ වන විට හෙලිවී තිබේ. මේ පිළිබඳව අපි දත්ත කිහිපයක් සළකා බලමු.

1978 අංක 04 දරණ ආයෝජන යමණ්ඩල පණත(BOI)යටතේ 2006 පෙබරවාරි 15 වනදා වර්ග කි.මී. 675 ක පමණ විශාලත්වයකින් යුත් විශේෂ ආර්ථික කලාපයක් ත්‍රිකුණාමලයේ නම් කරමින් ගැසට් කිරීමට කැබිනට් අනුමැතිය ලබාදී තිබේ. ඒ අනුව 1978 අංක 4 දරණ ර්ධෂ පනතේ අංක 22 වගන්තිය යටතේ ත්‍රිකුණාමල විශේෂ ආර්ථික කලාපය (Trincomale Special Economic Zone) 2006 ඔක්තෝබර් 16 දා අංක 1467/03 දරණ අති විශේෂ ගැසට් පත්‍රය යටතේ අවසර ලත් කලාපයක් බවට ප්‍රකාශයට පත් කරන ලදී.

එම අති විශේෂ ගැසට් පත්‍රය මෙසේයඃ

1978 අංක 04 දරණ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පණත යටතේ 22අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ආකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම පහත අ, ආ, ඇ, ඈ යන උපලේඛනයන්හි විස්තර කරනු ලබන මායිම තුළ පිහිටි ප්‍රදේශය මේ පණතේ කාර්යය සඳහා බලපත්‍ර ලත් කලාපයක් ලෙස මේ නියමයෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ
ජනාධිපති,
2006 සැප්තැම්බර් 30,
කොළඹ.

මෙම විශේෂ ආර්ථික කලාපයට අදාල ගැසට් පත්‍රයට අනුව,

1. කොඩියාර්පත්තුව ( මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) සියලුම ග්‍රාම නිලධාරි වසම්.
2. කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියලුම ග්‍රාම නිලධාරි වසම්.
3. තම්පලාගම දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 12ක් හා එහි සිට කි.මී. 01ක් දුර ප්‍රදේශයකට අයත්වන කොළඹ ත්‍රිකුණාමල මාර්ගයේ (6) බටහිර මධ්‍යම රේඛාවට අයත් සියලුම ප්‍රදේශ.
4. ත්‍රිකුණාමලය කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියලුම ග්‍රාම නිලධාරි වසම්.
5. කුච්චිවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 07ක්.
6. කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 14ක් හා එහි සිට කි.මී. 01ක් දුර ප්‍රදේශයකට අයත්වන කොළඹ ත්‍රිකුණාමල මාර්ගයේ (6) බටහිර මධ්‍යම රේඛාවට අයත් සියලුම ප්‍රදේශ මේ මගින් විශේෂ ආර්ථික කලාපයක් ලෙස නම්කර ඇත.

එනම් විශේෂ ආර්ථික කලාපයේ විශාලත්වය කොළඹ දිස්ත්‍රික්කයේ විශාලත්වයට සමානය. කොළඹ දිස්ත්‍රික්කයේ විශාලත්වය වර්ග කි.මී. 699කි. එහි ජලාශ හැරුණු විට ගොඩබිම් ප්‍රමාණය වර්ග කි.මී. 676කි. මෙම විශේෂ ආර්ථික කලාපයේ යෝජිත කර්මාන්ත ලෙස නැව්අලුත් වැඩියාව, බෝට්ටු නිෂ්පාදනය, ගබඩා පහසුකම් හා අනෙකුත් පහසුකම් සැපයීම,
තෙල් පිරිපහදු කටයුතු, බලශක්ති උත්පාදනය, පොහොර සහ බඡ ගෑස් ගබඩා කරණය, මත්ස්‍ය සම්පත් ආශ්‍රිත කර්මාන්ත හා සැකසුම් කර්මාන්ත හඳුන්වා දී ඇත.

ඉහත සිතියමේ දක්වා ඇති පරිදි ත්‍රිකුණාමල විශේෂ ආර්ථික කලාපය පහත වගුවේ දැක්වෙන පරිදි උප කලාප 06කට බෙදා ඇත.

| කලාප අංක | කලාපය පිළිබඳ විස්තරය | වර්ග ප්‍රමාණය (ව.කි.මී) |
|---|---|---|
| කලාප 1 | වරාය හා නාගරික කටයුතු පිළිබඳ කලාපය | 40.40 |
| කලාප 2 | සංචාරක කටයුතු සංවර්ධන කලාපය | 62.36 |
| කලාප 3 | කෘෂි කාර්මික සැලසුම් කලාපය | 180.14 |
| කලාප 4 | කාර්මික සංවර්ධන කලාපය | 168.48 |
| කලාප 5 | පාරිසරික සංචාරක කලාපය | 146.16 |
| කලාප 6 | නේවාසික කලාපය | 81.45 |
| මුළු' වර්ග ප්‍රමාණය (ව.කි.මී) | | 678.99 |

ඉන්දියාව මී කඩන්නේ අත ලෙවකන්න නොවේ. ඉන්දියාව මී කඩන්නේ මීවද අයිති පරිසරයේ හිමි කාරයින්ට වත් ඔවුන්ගේ කොටස නොදී සකල වපසරියම කටේ ඔබා ගැනීමටයි. ඉන්දියාව හා නෝර්වේ අතර ශ්‍රී ලංකාවේ තෙල් නිධි පිළිබඳව කිසියම් අවබෝධයක් තියෙන බව පෙනෙන්නට ඇත. සටන් විරාම ගිවිසුම කාලේ නෝර්වේ තෙල් ඇමති නිතර නිතර ඉන්දියාවේ බලශක්තියට අදාල බලධාරීන් මුණ ගැසුණි. ඒ අතර එරික් සෝල්හයිම් ලංකාවට ආවේත් ඔස්ලෝ ගියෙත් නවදිල්ලිය හරහා ලංකාවේදි සිදු කරන්න යනදේවල් වගේම සිදු කරපු දේවල් සියල්ල කලාපයේ බලවතා වන ඉන්දියාව දැනුවත් කිරීමෙන් පසුවය.

දැනට දින කිහිපයකට පෙර ශ්‍රී ලංකාවට සාගරය හරහා කේබල මගින් ඉන්දියාවෙන් විදුලියම්ලදී ගැනීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණි. ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් වලින්75% වඩා වැඩි ප්‍රමාණයක අයිතිය ඉන්දීය සමාගම් සතුය. ඉන්දියාව මේ මොන නාඩගමද නටන්න යන්නේ කියන එක ඉහත කී කරුණුත් තව බොහෝ සාක්ෂිත් සමග ඉතාමත් පැහැදිලිය. ඒත් අප සමහර අය කරන්නේ, ඔවුන් අපේ රටටත් වඩා ආදරය කරන

ඉන්දියාවට ඉන්දියාවේ ආර්ථික ව්‍යප්තවාදය ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීමට දැනුවත්වම ඉඩ ප්‍රස්ථා සලසා දීමයි. ස්වාධීනත්වය, ස්වාදීපත්‍යය ජප මන්ත්‍රයක් කරගත් අප ආර්ථික මර්මස්ථාන මෙන්ම ජාතික සම්පත් වෙනත් රාජ්‍යයකට නතු කිරීම මොන තරම් අමන කමක්ද. ඉදිරියේදී ශ්‍රී ලංකාවට අවාසිදායක තවත් ගිවිසුමක් අත්සන් කරන්න නියමිතය.

*ජ.වි.පෙ ජාත්‍යන්තර අංශය,*
*ඔස්ට්‍රේලියානු කමිටුව.*